**ආර්ථික වැඩපිළිවෙළෙහි ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා පැමිණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත මණ්ඩලයේ ශ්‍රී ලංකා සංචාරය නිමා වේ.**

**2016 සැප්තැම්බර් 23 දින**

| |
|---|
| රටක සංචාරය අවසන් කිරීමෙන් පසු දූත මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන පුවත්පත් නිවේදනයන්හි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අරමුදලේ) නිලධාරීන්ගේ මූලික නිරීක්ෂණයන් ඇතුළත් වේ. මෙම ප්‍රකාශනයේ ඇති අදහස් ජා.මූ.අරමුදලේ දූත කණ්ඩායමේ මතය වන අතර එමගින් අවශ්‍යයෙන්ම ජා.මූ.අරමුදලේ විධායක මණ්ඩලයේ මතය පිළිබිඹු නොකෙරෙයි. දූත මණ්ඩලයේ මූලික නිරීක්ෂණ පදනම් කරගෙන කළමනාකාරීත්වයේ අනුමැතියට යටත්ව ජා.මූ.අරමුදලේ නිලධාරීන් වාර්තාවක් පිළියෙළ කරන අතර එය ජා.මූ.අරමුදලේ විධායක මණ්ඩලයේ සාකච්ඡා කිරීමටත්, තීරණ ගැනීම සඳහාත් ඉදිරිපත් කෙරෙයි. |

ජේවූ ලී (Jaewoo Lee) මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ජා.මූ. අරමුදලේ නිලධාරීන් කණ්ඩායමක් 2016 වසරේ සැප්තැම්බර් මස 13 වැනි දින සිට 23 වැනි දින දක්වා කාලය තුළ දී, **අවුරුදු තුනක කාල පරාසයක් පුරා දිවෙන විස්තීරණ ණය පහසුකම** යටතේ ශ්‍රී ලංකා බලධාරීන් විසින් ක්‍රියාත්මක කරගෙන යනු ලබන ආර්ථික වැඩසටහනෙහි පළමු සමාලෝචනය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා කොළඹට පැමිණියේය. මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ රාජ්‍ය මූල්‍ය තිරසාර මට්ටමක පවත්වාගෙන යෑම සඳහා සහ සමාජීය හා සංවර්ධන වැඩසටහන සඳහා අවකාශය නිර්මාණය කිරීම වෙනුවෙන් වූ බලධාරීන්ගේ සුබවාදී ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට සහාය දැක්වීමයි. මෙම සංචාරය අවසානයේ දී ලී මහතා විසින් පහත සඳහන් ප්‍රකාශය නිකුත් කරන ලදී:

“දූත මණ්ඩලය පළමු ආර්ථික කාර්යසාධන සමාලෝචනය සම්පූර්ණ කිරීම පිළිබඳව රජය සමඟ නිලධාරී මට්ටමේ එකඟතාවක් ඇතිකර ගැනීම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේය. ඔක්තෝබර් මාසයේ දී වොෂින්ටන් නුවර පැවැත්වෙන ජා.මූ. අරමුදලේ සහ ලෝක බැංකුවේ වාර්ෂික සමුළුවේ දී මේ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කෙරෙනු ඇත

“සමස්තයක් ලෙස, 2016 වසරේ පළමු භාගයේ දී සාර්ව ආර්ථික ක්‍රියාකාරකම් සැලකීමේ දී ගෙවුම් තුලනය වැඩිදියුණු වීම හා මෑතකාලීනව ඇති වූ ගංවතුර නිසා ආර්ථික වර්ධනය අඩු වීම සහ ඉහළ උද්ධමනය යනාදී වශයෙන් වූ මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණි. වෙළඳපොළ විශ්වසනීයත්වය වර්ධනය වීමට හා විදේශීය තුලනය මත ඇති පීඩනය අඩු කිරීමට උපකාරී වන අන්දමින් රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම දූත මණ්ඩලයේ පැසසුමට ලක් වේ.

“දුෂ්කර වාතාවරණයක් යටතේ වුව ද ජා.මූ. අරමුදලේ සහයෝගය ලද ආර්ථික වැඩපිළිවෙල ක්‍රියාවට නංවා, ජූනි මාසය අවසන් වන විට සැපිරිය යුතු සියලු කාර්ය සාධන මට්ටම් සපුරාලීම පිළිබඳව දූත පිරිසේ ප්‍රශංසාව හිමි වේ. කෙසේ වෙතත්, වැඩසටහනෙහි ඉදිරි දැක්ම සම්බන්ධයෙන් ගත් විට විශේෂයෙන්ම බදු ප්‍රතිසංස්කරණ පැකේජය තවදුරටත් ප්‍රමාද නොකර ක්‍රියාත්මක කළ යුතුව ඇත.

“ඒ අනුව, 2016 හා 2017 සඳහා වන ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා උපකාරී වන එකතු කළ අගය මත බදු සංශෝධන ක්‍රියාත්මක කිරීමේ නෛතික ක්‍රියාවලිය රජය විසින් කඩිනම් කිරීම වැදගත් වේ. ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට අඩු මට්ටමක පවතින ශ්‍රී ලංකාවේ බදු ආදායම් ඉහළ නැංවීම සඳහා මැනවින් සකස් කරන ලද ඉහළ ගුණාත්මකභාවයකින් යුතු බදු ප්‍රතිපත්තියක් ආධාරයෙන් 2017 වසරේ අයවැය සකස් කළ යුතුව ඇත. වඩා පහසුවෙන් පුරෝකථනය කළ හැකි, කාර්යක්ෂම හා සාධාරණ ව්‍යුහයක් බවට බදු ක්‍රමය නැවත පරිවර්තනය කිරීම සහ රටේ අපේක්ෂිත සමාජයීය හා සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීමට උපකාරී වන අවශ්‍ය සම්පත් උත්පාදනය කර ගැනීම සඳහා නව දේශීය ආදායම් පනත හා සම්බන්ධ නෛතික ක්‍රියාවලිය ආරම්භ කිරීම වැදගත් පියවරක් වනු ඇත.

“උද්ධමනය ඉලක්කගත සීමාව තුළ පවත්වා ගැනීම සඳහා පූර්ව ක්‍රියාමාර්ගයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සම්බන්ධව ජා.මූ. අරමුදලේ දූත පිරිස යහපත් ආකල්පයක් දරයි. උද්ධමන පීඩන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සුපරීක්ෂාකාරීව  අධීක්ෂණය කළ යුතු අතර, උද්ධමනය හෝ ණය වර්ධනය අඛණ්ඩව ඉහළ යන්නේ නම් මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කළ යුතුය. විදේශ අංශයේ පවතින පීඩනය අවම කිරීම සඳහා විදේශ සංචිත යළි ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව ප්‍රයත්න දැරීම සහ විදේශ විනිමය වෙළඳපොළ තවදුරටත් දියුණු කිරීම සඳහා විනිමය අනුපාතිකයෙහි නම්‍යශීලීත්වය පවත්වා ගැනීම දිරිමත් කෙරේ. එහිදී මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය කෙරෙහි ගමන් කිරීම සඳහා,  බොහෝ විට ජා.මූ. අරමුදලේ තාක්ෂණික සහාය සමඟ වූ සැලසුම් පිළිබඳව දූත පිරිස විසින් සාකච්ඡා පවත්වන ලදී.

“පසුගිය වසර කිහිපය තුළ ලද තාක්ෂණික සහාය ද පදනම් කර ගනිමින් රජය විසින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙහි සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් සිදු කිරීම කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු  කිරීම දූත මණ්ඩලය විසින් දිරිමත් කෙරෙයි. මැදිකාලීන සාර්ව ආර්ථික අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා කලාපීය සහ ගෝලීය සැපයුම් දාමයන් සමඟ ඒකාබද්ධ වීම, ඉහළ මට්ටමක විදේශීය ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ පෞද්ගලික අංශයේ ආයෝජන අවස්ථාවන් ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත. තරඟකාරිත්වය ඉහළ නැංවීම තුළින් වාණිජ කටයුතු වැඩිදියුණු කර ගැනීම මෙන්ම පෞද්ගලික අංශයේ වර්ධනය ඉහළ නංවා ගැනීම ද ආර්ථික වර්ධනය සඳහා උපකාරී වනු ඇත”.

දූත පිරිස මෙම සංචාරයේ දී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, අග්‍රාමාත්‍ය වික්‍රමසිංහ, මුදල් අමාත්‍ය කරුණානායක, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති කුමාරස්වාමි යන මහත්වරුන් ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, වෙනත් රාජ්‍ය නිලධාරීන් සහ ව්‍යාපාරික ප්‍රජාවේ, සිවිල් සමාජයේ සහ ජාත්‍යන්තර හවුල්කරුවන්ගේ නියෝජිතයන් ද හමු විය.